සන්නස
SANNASA

විශ්වජිත් සන්දේශ් සූරියබණ්ඩාර

සන්නස වෙනුවෙන්ම ලියන ආදරණීය ම නවකතාව

# සිහිනයක්, වගේ....



21 වන කොටස

## ස්නේහාගේත් අකලංකගේත් කතාව

"ඔයා මේ දවස්වල හරිම කල්පනාවකින් ඉන්නෙ දුවේ. මං මේ කීපවතාවක්ම අහන්න කියලා හිත හිතා හිටියා" මේට්‍රන් සුනන්දා කීවා ය. ඒ වෙලාවේත් ස්නේහා සිටියේ ලෝකය ගැටලන්නට තරම් දිග කල්පනාවක ය. අකලංක සමරසේකරත් දොස්තර මේනක සිරිමාන්නත් ඇගේ සරළ සැහැල්ලු ලෝකය අවුල්කර දමා ඇතිවාක් මෙන් ස්නේහාට දැනී තිබුණි. හැම විනාඩියකම ඇගේ සිතේ හොල්මන් කළේ ඒ දෙදෙනා වරින් වර ඇගේ සිතට දැමූ දහසක් අනවශ්‍ය සිතුවිලි ය. සුනන්දා ගේ කතාවෙන් සිය කල්පනාව බිඳගත් ස්නේහා හිස ඔසවා බැලුවා ය.

"මොකද පුතේ මේ හැටි කල්පනාවක.. මං උදේ ඉඳන් බලං හිටියෙ.. ප්‍රශ්නයක් තියේ නං කියන්න.. හිතේ තද කරගෙන ඉන්නැතුව" සුනන්දා නැවත කීවා ය.

"එහෙමට කියල ප්‍රශ්නයක් නෑ මැඩම්" ස්නේහා කුමක් හෝ කිව යුතු නිසා කීවා ය. සුනන්දා සිනාසුණා ය. ස්නේහා කියන්නේ ඇත්ත නොවන බව ඇය දන්නා බව ඇගේ ඒ සිනාව කියයි. ඇගේ කරුණාවන්ත බැල්ම ස්නේහාට දැරිය නොහැකිය. "ප්‍රශ්න නැත්තෙත් නෑ මැඩම්.. ඒත් ඒහෙමයි කියල මං අවුල් වෙන්නෙ නෑ.. පුලුවන් විදිහට මූණ දෙනවා" ස්නේහා දෙවෙනුව කීවා ය.

"පහුගිය දවස්වල වෙච්ච දේවල් ඔයා වගේ දරුවෙකුට දරා ගන්න අමාරු බව මට තේරෙනවා දුව.. ඒත් මං හිතන්නෙ නෑ ඉස්සරහට එහෙම වෙයි කියල" සුනන්දා කියයි.

තමන් දැන් මුහුණ දෙමින් සිටින තත්වය සුනන්දා දන්නවා නම් ඇය මෙසේ නොකියනු ඇතැයි ස්නේහාට සිතුණි. සිදුවෙමින් පවතින සියල්ල ඇයට කියන්නට නොහැකි වීම ගැන ස්නේහා පසු තැවුණා ය. ඇය එදින ඇයට පැවරී තිබුණ වැඩ කටයුතු වෙනුවෙන් යොමු වුණේ ද ඒ කල්පනාවම සිත දරාගෙනය. දවල් වන විට දොස්තර සිරිමාන්න තමන්ගේ රෝගීන් බලන්නට ආවත් ස්නේහා ඔහුට නොපෙනී සිටින්නට උත්සාහ කළා ය. සිතට තවත් බර පටවාගත යුතු නැත. මේ හොඳටම ඇති ය. රැපියල් අස්සේ අලුක්කාල් ගහන්නට යා යුතු නැත.

හැලහැප්පීමක් නැති දින කීපයක් හෙමින් සීරුවේ ගෙවී ගියේ ය. ඒ දින කීපයේ කීප වතාවක් තාත්තාට කතා කරන්නට ඈ අමතක නොකළා ය. තාත්තා මඳක් අසනීපව සිටීම ඇගේ සිතට බරක් විය.

"අප්පච්චි මහන්සිවෙන්න යන්න එපා.. මං මේ සතියෙ සල්ලි එවන්නං. මේ ටිකේවත් ටිකක් විවේකගන්න" ස්නේහා කීවා ය.ඒ ඉල්ලීම් වලට අප්පච්චිගේ වැඩ නතර කරන්නට නොහැකි බව ඇය දැන සිටියත් එසේ නොකියා සිටින්නට ඇයට නොහැකි විය. කවුරු කොහොම කීවත් ඔහු වැඩ නවත්වන කෙනෙක් නොවේ.

"වැඩ නොකර හිටියොත් මං නිකම්ම ලෙඩෙක් වෙයි දුවේ" අප්පච්චි කියන්නේ ඇත්ත ය. වත්තේ පිටියේ තණ පඳුරු මත පය තබා ඇවිද්දේ නැත්නම් ඔහු ලෙඩ වනු ඇති බවට සැකයක් නැත. ඒ ඔහුගේ ජීවිතයයි. එයට බාධා නොකළ යුතුව ඇති නමුත් ඔහුගේ ශරීර සෞඛ්‍යය පිළිබඳ බරක් ස්නේහා ගේ සිතේ ඇත. "පුතා සල්ලි නේව්වට කමක් නෑ.. ගෙදර ඇතිවෙන්න බඩු තියෙනවා.. වෙනින් ඒ හැටි වියදමකුත් නෑ.. පුතා ගිය සුමානෙ එව්ව බඩුත් තාම පෙට්ටියෙමයි.. ඒව එලියට ගත්තෙවත් නෑ තාම"

"මං එව්ව බඩු..?" ස්නේහා අසන්නේ පුදුමයෙනි.

"ඇයි පුතේ අර සුපර්මාකට් එකක වෑන් එකකින් එවපු බඩු.. අපි මේ කියන්නමයි හිටියෙ ඔය අනවශ්‍ය දේවල් වලට නිස්කාරනේ වියදම් කරන්න එපාය කියලා.. අපට මේ ඉස්තරම් කෑම බීම ඕනෙ නෑ දුවේ. මේ වත්තෙ පිටියෙ වැවන දේ හොඳටම ඇති." අප්පච්චි කියූ මුල් වාක්‍යයෙන් පසු ඉතිරි කොටස ස්නේහාට ඇසුණේවත් නැති තරම් ය. තමා කිසිවක් එව්වේ නැතැයි කියා අප්පච්චිගේ සිතට අනවශ්‍ය බරක් දමන්නට ඇය කැමති නොවී ය. යම් කිසිවකු බරපතළ විහිළුවක් කරමින් සිටියි. ඇය සිතා සිටියේ නැවත රැකියාවට ආ පසු මේ බඩු එවීම නවතිනු ඇතැයි කියා ය. නමුත් ඒ සෙල්ලම දිගින් දිගටම සිදුවීම විශාල ප්‍රශ්නයක් ඇගේ සිතට ඇති කරයි. වහාම මෙය නැවැත්විය යුතුව ඇති නමුත් එවන්නා නොදැන එය කෙසේ කරන්නදැයි ඇයට නොවැටහෙයි.

සති අන්තයේ ගමට ගොස් පැමිණිය යුතු යයි ඈ සිතුවා ය. සවස ඉසුර කතා කළ පසු ගමේ යාමට තිබූ ඕනෑකම තවත් වැඩි වූවාක් සේ ඇයට දැනුණි.

"අපි පන්සලේ ප්‍රජා පුස්තකාලයක් පටන් ගන්නවා නංගි" ඔහු කීවේ ය.

"අනේ ෂෝක්.. ගමේ ළමයින්ට අවශ්‍යම වෙලා තිබ්බ දෙයක්.. මං පොත් ටිකක් අරගෙන දෙන්නං" ස්නේහා ඇත්තටම සතුටු වූවාය.

පුස්තකාලයක් නොමැතිවීම ගමේ තරුණ තරුණියන්ට තිබූ විශාල අඩුවකි. ඉසුර ඒ කාර්යයට අතගැසීම සතුටු විය යුතුම කරුණකි. ඔහුගේ මනා සංවිධාන හැකියාව මත එය සාර්ථක වනු ඇති බවට සැකයක් නැත.

"ඉතින් ඉස්සරහට මොනාද කරන්නෙ ඉන්නෙ?" ස්නේහා ඇසුවා ය. ඉසුර එකවර පිළිතුරක් නොදුන්නේ ය. "ඇයි කල්පනා කරන්නෙ?" ස්නේහා නැවත ඇසුවා ය.

"මට මේ දේශපාලනේ හරිම අප්පිරියයි නංගි" ඔහු කීවේ කළකිරීම රැඳුණ හඬිනි.

"දෙයියෝ සාක්කි.. පටන්ගත්ත ගමන්ම එපා වෙලා.. මොකද මේ?"

"මට මේ හොරු එක්ක වැඩ කිරිල්ල එපා වෙලා.. පාර්ලිමේන්තුවේ ඉඳන් ප්‍රාදේශීය සභාවට එනකල්ම ඉන්නෙ හොරු.. මුන්ගෙ ඒකායන අරමුණ කොතනින්ද හොරකමක් කරගන්නෙ කියන එක.. ඉහළ මට්ටමේ එවුන් මහා පරිමානයෙන් හොරකම් කරද්දි මේ අපේ මට්ටමේ එවුන් ගමේ පාරට ගල් අල්ලන එකෙනුත් ගහගන්නවා.. මුන් එක්ක රණ්ඩු කරලා මට මේ ටිකට හති.." ඔහු කියන්නේ රහසක් නොවේ. හොරකම් කිරීම රහසේ කෙරුණේ ඈත අතීතයේදී ය. අද එ ය එළි පිට සිදුවන්නක් බව ස්නේහා දනියි. එය එතැනින් නොනැවතී හොඳම හොරාට පිරිත් නූල් බඳින්නට හාමුදුරුවරු සිරගෙවලට වඩිති. හොඳම හොරාට බලය ලබා දෙන්නට සමහරු පොරකති. මේ අබුද්දස්ස යුගයේ කුමක් කළ යුතුදැයි ස්නේහාට නොවැටහෙයි.

"අපි අලුත් බලවේගයක් ගොඩනගන්න ඕනෙ නංගි.. මේ හොරු පන්නලා ඒ වෙනුවට අවංක මිනිස්සු ටිකකට බලය අරන් දෙන්න ඕනෙ.." ඉසුර ගේ විසඳුම පහසු එකක් නොවේ.

"අවංක මිනිස්සු කාල බලල හොයා ගන්නද අයියෙ.. හැම එකාම එනකොට අවංකයි.. එන්නෙ සුදු ඇඳගෙන.. ආවට පස්සෙනෙ හරි පාට පේන්න ගන්නෙ.."

"එහෙම කියලා බෑ ස්නේහා.. අපි මේ යන පාර වෙනස් කරන්නම ඕනෙ.. වෙනස් කරන්නම ඕනෙ.. මං ඉස්සරහට කැපවෙන්නෙ ඒ වෙනුවෙන්" ඉසුර ගේ දැඩි ස්වරය ස්නේහා ගේ සිතේ ඇති කරන්නේ බියකි. ඔහු කරදරයට පත්වෙනවා දකින්නට ඇය අකැමැතිය. පවතින ක්‍රමය තුළ ඉතිරිවී සිටින අවංක මිනිසුන් කීපදෙනාද ඉවත්ව යනවා දකින්නට ඇය කැමති නැත.

"මං සතිඅන්තෙ ගම එනවා අයියෙ.. ආවාම කතාකරමු" ස්නේහා කීවේ සිතේ ඇතිවූ බිය පහව යන්නටත් පෙර ය.

**මතු සම්බන්ධයි**



